රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2024.10.08

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු

වෙබ් අඩවි කර්තෘ

**ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ සිනමා ව්‍යාපෘතියක් හේතුවෙන් 2024.10.09 සිට 2024.10.15 දක්වා උඩරට මාර්ගයේ දුම්රිය ධාවනය කොළඹ කොටුව සිට ඇල්ල දුම්රිය ස්ථානය දක්වා සීමා කිරීම**

උක්ත කරුණු සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන) එන්. ජේ. ඉදිපොලගේ මහතා විසින් මා වෙත එවන ලද මාධ්‍ය නිවේදනය සුදුසු පරිදි ප්‍රචාරය සඳහා මේ සමග එවමි.

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

දුම්රිය
புகையிரத } GMF 35
Railway

ඔබේ අංකය
உமது இல. } ...........................
Your No.

දුරකථනය (සා. ක.)
தொலைபேசி (பொ. மு.) } 2431177
Telephone (G. M. R.)

E-mail : gmrslr@sltnet.lk

කාර්යාලය
அலுவலகம் } 2421281
Office

ෆැක්ස්
தொலைநகல் } 2446490
Fax

ශ්‍රී ලංකා දුම්රිය සේවය
இலங்கை புகையிரத சேவை
SRI LANKA RAILWAYS

මගේ අංකය
எனது இல. } ශ.ජී.විවිධ/2024
My No.

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர் அலுவலகம்,
த. பெ. 355, ஒல்கொட் மாவத்தை,
கொழும்பு 10.

General Manager's Office,
P. O. Box 355, Olcott Mawatha,
Colombo 10.

2024.10.08

අධ්‍යක්ෂ ජෙනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**<u>ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ සිනමා ව්‍යාපෘතියක් හේතුවෙන් 2024.10.09 දින සිට 2024.10.15 දින දක්වා උඩරට මාර්ගයේ දුම්රිය ධාවනය කොළඹ කොටුව සිට ඇල්ල දුම්රිය ස්ථානය දක්වා සීමා කිරීම.</u>**

2024.10.09 දින සිට 2024.10.15 දින දක්වා උඩරට දුම්රිය මාර්ගයේ ඇල්ල සහ දෙමෝදර අතර පිහිටි ආරුක්කු 9 පාලම මත ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ සිනමා පටයක් රූගත කිරීම හේතුවෙන් උඩරට දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහත දිනයන් හිදී පෙ.ව.07.30 සිට ප.ව.17.30 දක්වා කාලසීමාව තුල කොළඹ කොටුව සහ ඇල්ල දුම්රිය ස්ථාන දක්වා පමණක් සිදුකරනු ලබන බව දන්වා සිටිමි. මෙම සිනමා පටය ප්‍රදර්ශනය කිරීමෙන් පසු ශ්‍රී ලංකාව කෙරෙහි අමතර සංචාරක ආකර්ෂණයක් ඇතිවන බැවින් ප්‍රවාහන අමාත්‍යාංශයේ අනුමැතිය මත මෙම රූගත කිරීම සිදුකරනු අතර, අදාළ කාලසීමාව තුල දුම්රිය ධාවනය පහත පරිදි සිදුකිරිම සඳහා සැලසුම් කර ඇත.

**<u>2024.10.09 දින සිට 2024.10.15 දින දක්වා උඩරට මාර්ගයේ දුම්රිය ධාවන සැලසුම.</u>**

01. කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වන අංක 1005 (පොඩි මැණිකේ) දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානය දක්වා පමණක් ධාවනය කිරීම.

02. ඔක්තෝබර් 10,11,12 සහ 13 යන දිනයන් හිදී කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වීමට නියමිත "ඔඩිසි" දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානය දක්වා පමණක් ධාවනය කිරීම.

03. ඔක්තෝබර් 11,12,13 සහ 14 යන දිනයන් හිදී බදුල්ල සිට කොළඹ කොටුව දක්වා ධාවනය වීමට නියමිත "ඔඩිසි" දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරන අතර, එම දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාව වන පෙ.ව.08.55 ට පිටත් වේ.

04. බදුල්ල සිට කොළඹ කොටුව දක්වා ධාවනය වීමට නියමිත අංක 1006 (පොඩි මැණිකේ) දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරන අතර, එම දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාව වන පෙ.ව.09.40 ට පිටත් වේ.

05. බදුල්ල සිට කොළඹ කොටුව දක්වා ධාවනය වීමට නියමිත අංක 1008 දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරන අතර, එම දුම්රිය ඇල්ල දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාව වන පෙ.ව.11.15 ට පිටත් වේ.

06. මහනුවර සිට බදුල්ල දක්වා ධාවනය වන අංක 1126 දුම්රිය බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය දක්වා පමණක් ධාවනය කිරීම.

07. බදුල්ල සිට මහනුවර දක්වා ධාවනය වීමට නියමිත අංක 1596 දුම්රිය බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරන අතර, එම දුම්රිය බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාව වන පෙ.ව.13.15 ට පිටත් වේ.

මෙම මෙම සිනමා රූපගත කිරීමේ කටයුතු හේතුවෙන් දුම්රිය මගීන් හට සිදුවන අපහසුතාවය පිලිබඳව කනගාටුව ප්‍රකාශ කරන අතර, ඇල්ල දුම්රිය ස්ථානයෙන් සහ බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයෙන් ගමන් අවසන් කරන දුම්රියන් සඳහා එම ගමන් අවසන් කරන දුම්රිය ස්ථානයේ සිට බදුල්ල දක්වා ඉදිරි දුම්රිය ස්ථානයන් වෙත ගමන් කිරීම සඳහා බස්රථ යෙදවීමට කටයුතු සැලසුම් කර ඇති බව ද දන්වා සිටිමි.

ඇල්ල සහ බණ්ඩාරවෙල දුම්රිය ස්ථානයන්ගෙන් ගමන් ආරම්භ කිරීම සඳහා සැලසුම්කර ඇති දුම්රියන් වල ගමන් කිරීමට නියමිත, බදුල්ල සහ අතර මැදි දුම්රිය ස්ථාන වල සිට ගමන් කරන මගීන් සඳහා ද අදාළ දුම්රියන්ගෙන් ගමන් කල හැකි වන පරිදි සම්බන්ධිත බස් රථ පහසුකම් ලබාදීමට ද කටයුතු සැලසුම් කර ඇති බව තව දුරටත් දන්වා සිටින අතර මේ සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කරන්නේ නම් මැනවි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)

එච්. ජේ. ඉඳිපොලගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන) කාර්යාලය
දුම්රිය මූලස්ථානය
කොළඹ 10.